# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2452/23 - 2025 සැප්තැම්බර් මස 03 වැනි බදාදා - 2025.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 6/2017

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත**

9 වන වගන්තිය යටතේ වන නියමය

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මා විසින්, මේ නියමය මගින්, එම පනතේ 9 වන වගන්තිය යටතේ සාදන ලදුව අංක 2142/74 දරන සහ 2019 සැප්තැම්බර් 26 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි "යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ" යන වචන වෙනුවට "වර්තමානයේ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ලෙස හැඳින්වෙන පලාලි ගුවන් තොටුපොළ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි උපලේඛනය ඉවත් කර, ඒ වෙනුවට පහත උපලේඛනය ආදේශ කිරීමෙන් :-

**"උපලේඛනය**

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් උතුර, තෙල්ලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මයිලඩ්ඩි උතුර, මයිලඩ්ඩි දකුණ සහ පලාලි ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි මූලික පිඹුරු අංක 1579 මගින් බෙදා වෙන් කළ කැබලි අංක 1 සිට 456 දක්වා වූ කැබලිවලින් නිරූපිත "වර්තමානයේ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ලෙස හැඳින්වෙන පලාලි ගුවන් තොටුපොළ" නමැති අක්කර 349-රූඩ් 03-පර්චස් 35.9 ක් වූ ගුවන් තොටුපොළ ධාවන පථය සහ එම ධාවන පථයට යාබදව එයට උතුරු දෙසට වන්නට පිහිටි ගුවන් තොටුපොළට අයත් සම්පූර්ණ භූමි භාගය.".

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ
සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2025. සැප්තැම්බර් මස 01 දින,
කොළඹ දී ය.

EOIG- 09 - 0032

1A - G 45289 — 39 (2025/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*